## ග්‍රන්ථ විවේචන

**Buddhism, Human Rights and Social Renewal**
**By Dr. Nalin Swaris**

*(බුදු දහම, මානව හිමිකම් සහ සමාජ ප්‍රතිජීවනය*
*ලේඛක: ආචාර්ය නලින් ස්වාරිස්)*

*Asian Human Rights Commmission* (ආසියානු මානව හිමිකම් කොමිසම),
*Hong Kong. ISBN 962-8341-11-9*

තපෝවනයේ සුතධර හිමි

බුදුසමය පුද්ගලික විමුක්තිය මිස සමාජ විමුක්තිය නොසලකන දහමකැයි ප්‍රචලිත අදහසින් ඈත්ව පුද්ගලයා හා සමාජය එකිනෙකාහට දක්වන අවියෝජනීය සම්බන්ධය මතුකොට සමාජ ප්‍රගමනයෙහිලා යොදාගත හැකි පදනම් දර්ශනයක් ලෙස ඇගයීමකට ලක්කෙරෙන යථෝක්ත කෘතිය ප්‍රබුද්ධ පාඨක ජනතාවගේ අවධානයට ලක්විය යුත්තකි.

ග්‍රන්ථාවසානයේ දක්වෙන අන්දමට මෙහි කතුවරයා දර්ශනය හා දේවධර්මවාදය මැනවින් හැදෑ, සමාජ දර්ශනය හා සංවර්ධන පිළිබඳ ප්‍රවීණ ආචාර්යවරයෙකු වන මානව විමුක්තිය පිළිබඳ බුදුරදුන්ගේ මාර්ගය මැයෙන් ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධනයක් ද සම්පාදනය කොට ප්‍රකාශයට පමුණුවා ඇති ආචාර්ය නලින් ස්වාරිස් මහතා ය.

කතුවරයා සිය සංදේශනය ආරම්භ කරන්නේ දහඅටවන සියවසේ අවසාන භාගයේදී තරම බටහිර විද්වතුන් හා ක්‍රිස්තියානි දේවධර්මාචාර්යවරුන් විසින් සිද්ධාර්ථ ගෞතමයන් ප්‍රචලිත අර්ථයෙන් ආගමික නායකයෙකු ලෙස හඳුන්වාදෙනු ලැබීම නිසා උන්වහන්සේගේ සමාජය, දේශපාලනය, හා ආර්ථිකය පිළිබඳ ඉගැන්වීම්වලට නියමිත අවධානය යොමු නොවූ ආකාරය ඉදිරිපත් කරමිනි. විශේෂයෙන්ම